සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

Second Term Test - Grade 13 - 2019

විභාග අංකය ..... නර්තනය (දේශීය) I කාලය පැය දෙකයි

වැදගත්

අංක 1 සිට 25 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත් පිළිතුර තෝරා ඊට අදාල අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහනෙහි යොදන්න.

◈ **උපදෙස්: මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 100 කි.**

01. තෙයියත් තෙයියත් තෙයියත් තාම්. තේයි තාම් තෙයි තෙයි තත් තත් තා මෙය,
1. උඩරට නර්තන සම්ප්‍රදායේ අටවන පා සරඹය වේ.
2. උඩරට නර්තන සම්ප්‍රදායේ පා සරඹ හමාර පදය වේ.
3. සබරගමු නර්තන සම්ප්‍රදායේ හතරවන මණ්ඩි පදය වේ.
4. පහතරට නර්තන සම්ප්‍රදායේ හතරවන පා සරඹ වේ.
5. පහතරට නර්තන සම්ප්‍රදායේ පා සරඹ හමාර පදය වේ. (.....)

02. නාගයකු කර වටහේ දරා සිටින දෙවියන්ගේ විලාසයක් ගෙන හැර පාන්නා වූ ප්‍රසිද්ධ වන්නමක් වනුයේ,
1. උඩරට නර්තන සම්ප්‍රදායේ නෙයඩි වන්නමයි.
2. උඩරට නර්තන සම්ප්‍රදායේ උරගා වන්නමයි.
3. උඩරට නර්තන සම්ප්‍රදායේ සුරපති වන්නමයි.
4. සබරගමු නර්තන සම්ප්‍රදායේ නාග ගජගා වන්නමයි.
5. සබරගමු නර්තන සම්ප්‍රදායේ අටකුරු ගාහක වන්නමයි. (.....)

03. කුංදඩ කුංජිං තරිකිට ජිංතක ජිංතක තරිකිට..... මෙම අලංකාර බෙර පදයට අයත් වන්නේ,
1. මාත්‍රා 4 + 4 තනතිතේ තාල රූපයට ය.
2. මාත්‍රා 2 + 3 දෙතිතේ තාල රූපයට ය.
3. මාත්‍රා 3 + 4 තනිතිතේ තාල රූපයට ය.
4. මාත්‍රා 2 + 4 දෙතිතේ තාල රූපයට ය.
5. මාත්‍රා 2 + 2 + 3 තුන්තිතේ තාල රූපයට ය. (.....)

04. උඩරට නර්තන සම්ප්‍රදායේ මඟුල් බෙර වාදනයේදී වාදන කරනු ලබන අනු පිළිවෙළ වන්නේ,
1. දේව පදය, ආශීර්වාද පදය, ගුරු පදය හා වට්ටම් පිරීමේ පදය වේ.
2. දේව පදය, ගුරු පදය, ආශීර්වාද පදය, හා වට්ටම් පිරීමේ පදය වේ.
3. ආශීර්වාද පදය, දේව පදය, ගුරු පදය හා වට්ටම් පිරීමේ පදය වේ.
4. ගුරු පදය, දේව පදය, ආශීර්වාද පදය හා වට්ටම් පිරීමේ පදය වේ.
5. දේව පදය, ගුරු පදය, වට්ටම් පිරීමේ පදය හා පළමු වට්ටම වේ. (.....)

05. 'අං දෙක වග පොලු දෙකටයි ගන්නේ'' මෙහි දෙවන කවි පදය වන්නේ,
1. ඉහ මොළ කිරි වලටයි අර ගන්නේ
2. උගුරු දණ්ඩ කිරි පිඹින්න ගන්නේ
3. දෙවියන් යැදලා අවසර ගන්නේ
4. වරම් ලබා අවසර ඉල්ලන්නේ
5. මේ ලෙස කිරි උතුරන්ට පැවැත්නේ (.....)

06. වම් අත දණහිස මතද, දකුණු අතින් හම්ස පක්ෂ මුද්‍රාවද සහිතව දුෂ්කර ඉරියව්වක යෙදී සිටින නළඟන රූපය හමු වී ඇත්තේ,
1. අනුරාධපුර යුගයේ කුට්ටම් පොකුණින් ය.
2. ඇම්බැක්කේ ගඩලාදෙණිය විහරයෙන් ය.
3. දෙවුන්දර උපුල්වන් දේවාලයෙන් ය.
4. බෙන්තොට ගලපාත ගලතුරු මුල රජ මහා විහාරයෙන් ය.
5. ගම්පල යුගයේ ඇම්බැක්කේ දේවාලයෙන් ය. (.....)

07. 'ඈත එපිට දීපංකර මුණි විවිරණ ගන්නේ'' මෙහි
1. ලඝු මාත්‍රා 12 ක් හා ගුරු මාත්‍රා 05 කි.
2. ලඝු මාත්‍රා 14 ක් හා ගුරු මාත්‍රා 03 කි.
3. ලඝු මාත්‍රා 15 ක් හා ගුරු මාත්‍රා 02 කි.
4. ලඝු මාත්‍රා 12 ක් හා ගුරු මාත්‍රා 06 කි.
5. ලඝු මාත්‍රා 14 ක් හා ගුරු මාත්‍රා 04 කි. (.....)

08. 'ගැමි නාටක ප්‍රවේශය' සහ 'යක්කම් පහ' යන ග්‍රන්ථ රචනා කරන ලද්දේ පිළිවෙලින්,
1. එදිරිවීර සරච්චන්ද්‍ර හා මුදියන්සේ දිසානායක ය.
2. මුදියන්සේ දිසානායක හා බී.පී. අහුගොඩ ය.
3. එදිරිවීර සරච්චන්ද්‍ර හා පේ.ඊ. සේදරමන් ය.
4. එදිරිවීර සරච්චන්ද්‍ර හා සරත් විජේවර්ධන ය.
5. මුදියන්සේ දිසානායක හා එදිරිවීර සරච්චන්ද්‍ර ය (.....)

09. 'කුදංත ගත දොං වට්ටම' හා දොං ජිංතගත දොංත වට්ටම' නර්තනය කරනු ලබන්නේ,
1. මාත්‍රා 2 + 2 + 4 මාත්‍රා 2 + 3 තාල රූප වලටය.
2. මාත්‍රා 2 + 3 මාත්‍රා 2 + 2 + 2 + 4 තාල රූප වලටය.
3. මාත්‍රා 2 + 2+ 2 + 4 මාත්‍රා 2 + 3 තාල රූප වලටය.
4. මාත්‍රා 2 + 2 + 3 මාත්‍රා 2 + 3 තාල රූප වලටය.
5. මාත්‍රා 2 + 2 + 4 මාත්‍රා 2 + 4 තාල රූප වලටය. (.....)

10. 'රළලා උපුලා ලෙළුම තුලායා නෙතලා බැමලා බවවාලාය' යන කවිය ඇතුළත් වනුයේ,
1. ගම්පල යුගයේ මුල් භාගයේ ලියැවුණු මයුර සංදේශයේ ය.
2. කෝට්ටේ යුගයේ ලියැවුණු මයුර සංදේශයේ ය.
3. ගම්පල යුගයේ අග භාගයේ ලියැවුණු මයුර සංදේශයේ ය.
4. කෝට්ටේ යුගයේ ලියැවුණු සැළලිහිණි සංදේශයේ ය.
5. කෝට්ටේ යුග්යේ ලියැවුනු කෝකිල සංද්ශෙයේ ය. (.....)

11. සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය සහ උඩරට නර්තන සම්ප්‍රදායේ විකාශය පිළිබඳ ස්වර්ණමය යුගය වන්නේ,
1. මහනුවර යුගය සහ දඹදෙණි යුගයයි.
2. කෝට්ටේ යුගය සහ ගම්පල යුගයයි.
3. මහනුවර යුගය සහ කොළඹ යුගයයි.
4. කෝට්ටේ යුගය සහ මහනුවර යුගයයි.
5. කෝට්ටේ යුගය හා දඹදෙණි යුගයයි. (.....)

12.



A

B

ඉහත A සහ B රූප සටහන් වලින් දැක්වෙන්නේ,
1. එදිරිවීර සරච්චන්ද්‍ර එළිමහන් රංග පීඨය හා මරදාන ටවර් රඟහලය.
2. විලියම් ශේක්ෂ්පියර්ගේ සුප්‍රකට ග්ලෝබ් රඟහල හා මරදාන ටවර් රඟහලය.
3. ග්‍රීසියේ එපිඩෝර්ස් රඟහල හා මරදාන ටවර් රඟහලය.
4. ග්‍රීසියේ එපිඩෝර්ස් රඟහල හා නෙළුම් පොකුණ රඟහලය.
5. එදිරිවීර සරච්චන්ද්‍ර එළිමහන් රංග පීඨය හා විලියම් ශේක්ෂ්පියර්ගේ සුප්‍රකට ග්ලෝබ් රඟහලය. (.....)

13. ලංකාවේ ප්‍රථම අංග සම්පූර්ණ ප්‍රෝසීනියම් ආරුක්කු වේදිකාව වන්නේ,
1. 2011 නොවැම්බර් මස 06 වන දින ඉදිකළ නෙළුම් පොකුණ රඟහලයි.
2. 1911 දෙසැම්බර් 06 වන දින ඉදිකළ මරදාන ටවර් රඟහලයි.
3. 1910 දෙසැම්බර් 06 වන දින ඉදිකළ මරදාන ටවර් රඟහලයි.
4. 1912 නොවැම්බර් මස 06 වන දින ඉදිකළ නෙළුම් පොකුණ රඟහලයි.
5. 1911 දෙසැම්බර් මස 06 වන දින ඉදිකළ ඊගල් ශාලාවයි. (.....)

14. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ග්‍රීක රංග භූමි ආකෘතිය අනුව නිර්මාණය වූවකි.
1. එදිරිවීර සරච්චන්ද්‍ර එළිමහන් රංග පීඨය
2. විලියම් ශේක්ෂ්පියර් රංග පීඨය
3. ඊගල් නෘත්‍ය රඟහල
4. එපිඩෝරස් රඟහල
5. සුප්‍රකට ග්ලොබ් රඟහල (.....)

15. බැලේ රංග කලාව සාමාන්‍ය රසිකයින්ට ද රස විඳිය හැකි කලා මාධ්‍යයක් බවට පත් කළේ,
1. 14 වන ලූවී රජු විසිනි.
2. මහා පීටර් රජු විසිනි.
3. 8 වන හෙන්රි රජු විසිනි.
4. මාරියස් පෙටිපා විසිනි.
5. ජින් ජෝර්ජ් නෝර්වේ විසිනි. (.....)

16.

A



B

ඉහත A සහ B රූප සටහන් වලින් දැක්වෙන්නේ,
1. ද නට් ක්‍රැකර් සහ හංසවිල බැලේ නාට්‍යයේ අවස්ථාවකි.
2. කුඹී කථාව සහ නල දමයන්ති මුද්‍රා නාට්‍යයේ අවස්ථාවකි.
3. ද නට් ක්‍රැකර් සහ නිදි කුමරිය බැලේ නාට්‍යයේ අවස්ථාවකි.
4. නල දමයන්ති සහ කුඹී කථාව මුද්‍රා නාට්‍යයේ අවස්ථාවකි.
5. නිදි කුමරිය සහ හංසවිල බැලේ නාට්‍යයේ අවස්ථාවකි. (.....)

17. කේරලයේ පැවති නෘත්‍ය නාටක ඇසුරෙන් විධිමත් සම්ප්‍රදායක් ලෙස කථකලි නර්තනය ගොඩ නංවන ලද්දේ,
1. කැලිකට්හි රාජා ජැමොරින් රජු විසිනි
2. වල්ලතෝල් නාරායන මෙනන් විසිනි.
3. කොට්ටාරක්කාර තාම්පුරන් රජු විසිනි.
4. චක්කියාර් බ්‍රාහ්මණයන් විසිනි.
5. රවීන්ද්‍රනාත් තාගෝර් විසිනි. (.....)

18. කථක් නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පීන් වනුයේ,
1. බිර්ජු මහාරාජ්, අච්චන් මහාරාජ් හා රවීන්ද්‍රනාත් තාගෝර් ය.
2. නවාබ් වජීද් අලීෂා, රාජා ජැමොරින් රජු සහ අච්චන් මහාරාජ් ය.
3. අච්චන් මහාරාජ්, කල්කා ප්‍රසාද් හා රවීන්ද්‍රනාත් තාගෝර් ය.
4. ජිනදාස වික්‍රමසිංහ, කල්කා ප්‍රසාද් හා වල්ලතෝල් නාරායන මෙනන් ය.
5. කල්කා ප්‍රසාද්, බිර්ජු මහාරාජ් හා නවාබ් වජීද් අලීෂා ය. (.....)

19. රසභාව පිළිබඳව අදහස් දැක්වූ පෙරදිග මතවාදීන් වනුයේ,
1. භරතමුණි, නන්දිකේශ්වර හා උද්ගම ධනංජය හා සරත් විජේවර්ධන ය.
2. නන්දිකේශ්වර, උද්ගම ධනංජය හා සරත් විජේවර්ධන ය.
3. භරතමුණි, අභිනව ගුප්ත හා ඩබ්.බී. මකුලොළුව ය.
4. භරතමුණි, නන්දිකේශ්වර හා සරත් විජේවර්ධන ය.
5. භරතමුණි, ප්ලේටෝ හා ඇරිස්ටෝටල් ය. (.....)

20. සිංහල ප්‍රශස්ති කාව්‍යයක් ලෙස පිළිගැනෙන 'පැරකුම්බා සිරිත' රචනා වී ඇත්තේ,
1. මහනුවර යුගයේ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍ර සිංහ රජතුමා වෙනුවෙනි
2. ගම්පල යුගයේ හතරවන බුවනෙකබා රජතුමා වෙනුවෙනි.
3. කෝට්ටේ යුගයේ හතරවන පරාක්‍රමබාහු රජතුමා වෙනුවෙනි.
4. දඹදෙණි යුගයේ දෙවන පරාක්‍රමබාහු රජතුමා වෙනුවෙනි.
5. කෝට්ටේ යුගයේ හයවන පරාක්‍රමබාහු රජතුමා වෙනුවෙනි. (.....)

21. 'දොංත ගතම් දොංත ගතිගතම් තත් රෙගතම් තත් රෙගති ගතම්'' මෙම බෙර පදයට අනුව සභාවට පිවිසෙන කෝලම් චරිතය වන්නේ,
1. අණබෙරකරු ය. 2. ලෙංචිනා ය. 3. මුදලි ය. 4. ජසයා ය. 5. නොංචි ය.
(.....)

22. ' මුරුගන් දෙවියන් හා 'කන්නගී දේවිය' වෙනුවෙන් පවත්වනු ලබන ද්‍රවිඩ ගැමි නැටුම් දෙකක් වනුයේ,
1. කාවඩි හා කෝලට්ටම් ය.
2. කරණට්ටම් හා කරගම් ය.
3. කාවඩි හා කරණට්ටම් ය.
4. කරගම් හා කෝලාට්ටම් ය.
5. කෝලාට්ටම් හා පින්නල් කෝලාට්ටම් ය. (.....)

23. නර්තන කලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු විමසීමේදී 'කොරවක්ගල' හා 'පාලමොට්ටායි' සෙල්ලිපි දෙක අයත් වන්නේ,
1. අනුරාධපුර හා පොළොන්නරු යුගයන්ට ය.
2. පොළොන්නරු හා මහනුවර යුගයන්ට ය.
3. අනුරාධපුර හා ප්‍රාග් ඓතිහාසික යුගයන්ට ය.
4. අනුරාධපුර හා දඹදෙණි යුගයන්ට ය.
5. පොළොන්නරු හා ප්‍රාග් ඓතිහාසික යුගයන්ට ය. (.....)

24. ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි සහ අරිසෙන් අහුබුදු විසින් රචනා කරන ලද වන්නම් දෙකකි.
1. සමනල වන්නම හා මරඟන වන්නම
2. මරඟන වන්නම හා යශෝදරා වන්නම
3. සමනළ වන්නම හා ආනන්ද ජයන්ති වන්නම
4. හංස වන්නම හා මහබෝ වන්නම
5. යශෝදරා වන්නම හා හංස වන්නම (.....)

25. 'වලියක් මංගල්‍ය' ශාන්ති කර්මය පවත්වනු ලබන්නේ,
1. කොහොඹායක් කංකාරි ශාන්ති කර්මය අවසානයේ දී ය.
2. දළදා පෙරහැර අවසානයේ මහා විෂ්ණු දේවාලයේදී ය.
3. දෙවොල් මඩු ශාන්ති කමර්ය අවසානයේදී ය.
4. බලි ශාන්ති කර්මය අවසානයේ දී ය.
5. කුඹල් පෙරහැර අවසානයේ මහා විෂ්ණු දේවාලයේ දීය. (.....)

◈ **26 -35 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට අදාල පිළිතුරු යොදා සම්පූර්ණ කරන්න.**

26. ''කිටි කිටිතක කිටි කිටි ගුද කිටි ගුද' මෙය ..... නර්තන සම්ප්‍රදායේ පස්වන බෙර සරඹය වේ.

27. භරත නාට්‍යම්හි වර්තමානයේ දක්නට ලැබෙන රංග වස්ත්‍රාභරණ ඉතා අලංකාර ලෙස නිර්මාණය කිරීමට දායක වී ඇත්තේ ..... විසිනි.

28. රස සිද්ධාන්ත අනුව ස්ථායිභාව අවධි කිරීමට මුල්වන හේතුව ..... යන්න භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රයෙහි සඳහන් වේ.

29. බෞද්ධ වෙහෙර විහාර වල තේවා වාදනය සඳහා ..... ප්‍රධාන අවනද්ධ භාණ්ඩය වශයෙන් භාවිතා කරයි.

30. නර්තන අංගයක් සඳහා රංග රටා නිර්මාණයේදී ..... භාවිතය පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ.

31. ම්‍රාතා 2 + 2 + 2 + 4 තාල රූපය භාවිතා කරමින් ..... වට්ටම් නර්තනය කරනු ලබයි.

32. මහනුවර දළදා පෙරහැර විධිමත්ව සංවිධානය කිරීම කරන ලද්දේ ..... රජතුමාගේ කාලයේ දීය.

33. ප්‍රථමවරට රජයේ පාසල් වල නර්තන විෂයය ඉගැන්වීම ..... වර්ෂයේ දී ආරම්භ විය.

34. නවීන තාක්ෂණයෙන් යුතුම ශ්‍රී ලංකාවේ නිර්මාණය වූ ..... රඟහල පහසුකම් සහිත විචිත්‍ර රංග ශාලාවකි.

35. ශාන්ති කර්ම වලදී සතුන්ට, දෙවියන්ට ග්‍රහයින්ට ආරාධනය කර පිරිවටයක් ඉවත් කරනු ලබන්නේ ..... කවි ගායනය කිරීමෙන් අනතුරුව ය.

◈ **36-50 තෙක් ප්‍රශ්නවලට අදාල පිළිතුරු තිත් ඉරමත ලියන්න.**

36. වන්නම් ප්‍රශස්ති, හටන් ආදී ගායනා පැවැත්වූ ස්ථානය හා එය අයත් යුගය නම් කරන්න.
1. ස්ථානය ..... 2. යුගය .....

37. ශ්‍රී ලංකාවේ නර්තන ගුරු භවතුන් පුහුණු කළ මුල්ම රජයේ ගුරු විද්‍යාලය හා එය ආරම්භ කළ වර්ෂය ලියන්න.
1. ගුරු විද්‍යාලය ..... 2. වර්ෂය .....

38. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ ගායනය සහිත දීර්ඝතම හා ගායනය රහිත දීර්ඝතම නර්තන අංග වනුයේ,
1. ගායනය සහිත .....
2. ගායනය රහිත .....

39. 'තහලම් කල බෙර තම්මැට පට තන්තිරු ඩමරු' යන කවි පදය ඇතුලත් සංදේශ හා යුගය ලියන්න.
1. සංදේශය ..... 2. යුගය .....

40. ප්‍රථම වරට බැලේ නර්තන පුහුණු පාසැලක් ආරම්භ කළ රජු සහ එම ආයතනය නම් කරන්න.
1. රජු ..... 2. ආයතනය .....

41. එම රජුගේ රජ වාසලේ නර්තන නිර්මාපකයන් අතුරින් ඇති දක්ෂ නිර්මාණකරුවන් දෙදෙනක් වන්නේ,
1. ..... 2. .....

42. බැලේ නාට්‍ය කලාවේ නිජබිම ලෙස හඳුන්වන රට හා මුල්ම බැලේ නාට්‍යයේ නම ලියන්න.
1. රට ..... 2. මුල්ම බැලේ නාට්‍ය .....

43. ප්‍රස්තාරකරණයේ දී භාවිතා කරන ''තිත්'' ''තෙයි'' සංකේත හඳුන්වන නාම දෙකක් වන්නේ,
1. ''තිත්'' ..... 2. ''තෙයි'' .....

44. නවීන තක්ෂණයෙන් යුත් විචිත්‍ර රංග ශාලාවක ඉතා වැදගත් අංග දෙකකි.
1. ..... 2. .....

45. භරත නාට්‍යම් හා කථකලි නර්තනය ඉගැන්වෙන ප්‍රධාන ආයතන දෙක ලියන්න.
1. ..... 2. .....

46. සන්නියකුමේ එන රීරි යකා සහ කළු යකාගේ චරිතය සඳහා භාවිතා කරන වර්ණ වනුයේ,
1. රීරි යකා .....2. කළු යකා .....

47. කර්ණාටක තාල පද්ධතියේ එන චතශ්‍ර සහ ඛණ්ඩ ජාති සඳහා සමාන වන දේශීය තාල වන්නේ,
1. චතශ්‍ර ජාති ..... 2. ඛණ්ඩ ජාති .....

48. ද නට් ක්‍රැකර් බැලේ නාට්‍ය රුසියාවේ දී වේදිකා ගත වූ වර්ෂය හා නගරය කුමක්ද?
1. වර්ෂය ..... 2. නගරය .....

49. 'තා තක්කඩ කඩතක ජික්කඩ කඩතක තනකු ජෙනකු තක ජෙංගත් තදිකින තොම්' මෙම කස්තිරම් කොටස අයත් නර්තන අංග හා සම්ප්‍රදාය ලියන්න.
1. නර්තන අංගය ..... 2. සම්ප්‍රදාය .....

50. හංසවිල හා නිදි කුමරිය බැලේ නාට්‍ය වල සංගීතය හා රංග රචනය කළ ශිල්පීන් වන්නේ,
1. සංගීතය ..... 2. රංග රචනය .....

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

52	S	II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

Second Term Test - Grade 13 - 2019

විභාග අංකය ..... නර්තනය (දේශීය) II කාලය පැය තුනයි

වැදගත්

පළමුවන කොටසේ ප්‍රශ්න 01 හා 02 අනිවාර්ය වේ. II හා III, යන කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
සෑම ප්‍රශ්නයකටම (I) කොටසට ලකුණු 06 ක් ද, (II) කොටසට ලකුණු 06 ක් ද, (III) කොටසට ලකුණු 08 ක් ද වශයෙන් මුළු ලකුණු 20 ක් හිමි වේ.

I කොටස

01. i. මංගලම් නර්තන අංගයට අයත් බෙර පදය හා කවි පදයක් ප්‍රස්තර කරන්න.
ii. පහත සඳහන් කවි පද දෙක අදාල තිත් රූපයට අනුව ප්‍රස්තාර කරන්න.
'රන්විල රිද්දි විල කෙළිනා බිසවුන්ට
මැණික් විලේ දිය නාලා ගොඩ වෙන්ට''
iii. මැදුම් මහ දෙතිතට අයත් වන්නමක කස්තිරම ප්‍රස්තාර කරන්න.

02. ''විවිධ ඓතිහාසික මූලාශ්‍ර නර්තන කලාවේ ප්‍රගතයට හේතු වී ඇත.
i. කෝට්ටේ යුගයේ නර්තන කලාවට භාරතීය ආභාෂය ලද බවට සංදේශ කාව්‍යයක් ඇසුරින් සාධනයක් ඉදිරිපත් කරන්න.
ii. ශාන්තිකර්ම සඳහා රාජ්‍ය අනුග්‍රහය පැවති බව කෝට්ටේ හා මහනුවර යුග ඇසුරෙන් සාධකයක් ඉදිරිපත් කරන්න.
iii. අයදතනයේ නර්තන කලාවේ ප්‍රගමනයට සමාජ ආර්ථික ප්‍රවණතා හා තාක්ෂණික ශිල්ප ක්‍රම බලපා ඇති ආකාරය නිදසුන් සහිතව විස්තර කරන්න.

II කොටස

03. දේශීය ශාන්ති කර්ම නර්තන, ගායන, වාදන හා නාට්‍යමය ලක්ෂණ වලින් පරිපූර්ණය
i. කොහොඹාකංකාරිය ශාන්තිකර්මයේ ගායනය සහිත නර්තන අංග දෙකක් නම් කර ගායනය රහිත නර්තන අංගයක් පිළිබඳ විග්‍රහයක් කරන්න.
ii. උඩරට හා සබරගමු ශාන්ති කර්ම වලදී යොදා ගන්නා ප්‍රධාන වාද්‍ය භාණ්ඩ දෙකක සමාන අසමානතා පිළිබඳ විග්‍රහයක් කරන්න.
iii. ඔබ කැමති ශාන්ති කර්මයක නාට්‍යමය අවස්ථාවක් තෝරාගෙන එහි අනුරූපණය, සමාරෝපය, සහ සංවාද පිළිබඳ විමසීමක් කරන්න.

04. අතීත සාම්ප්‍රදායික රඟ මඩලේ මෙන්ම නූතන වේදිකා ප්‍රසංග වලදී ශිල්පීන්ගේ නිර්මාණශීලි ක්‍රියාකාරිත්වය වඩාත් තීව්‍ර කිරීමට රංගාලෝකය බෙහෙවින් බලපායි.
i. අතීත ශාන්තිකර්ම රඟ මඩලතුළ ආලෝකකරණය සඳහා යොදාගත් පහන් වර්ග 04 ක් නම් කර ඉන් එකක් කෙටියෙන් හඳුන්වන්න.
ii. ප්‍රාසාංගික නර්තන අංගයකට ප්‍රේක්ෂක ආකර්ෂණය ලබා ගැනීම සඳහා උසස් ගුණාත්මකභාවයකින් යුතුව ආනුෂාංගික අංග සුසංයෝග බව ඉතා වැදගත්ය. උදාහරණ සහිතව විස්තර කරන්න.

iii. ස්වභාවික වස්තූන්ගෙන් සොයාගත් අලෝකය වර්තමානයේ රංගාලෝකකරණය ලෙසින් ස්වාධීන කලාවක් බවට ක්‍රමිකව විකාශය වූ ආකාරය පැහැදිලි කරන්න.

05. 'ගැමි නැටුම් හා එහි ගායනා වලින් හෙළි වන්නේ ඔවුන්ගේ ජීවන රටාවේ අව්‍යාජත්වයයි.'

i. සිංහල ගැමි නැටුම් දෙකක ගායනා උදාහරණයට ගෙන ඉහත කියමන පැහැදිලි කරන්න.

ii. සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් වල පොදු ලක්ෂණ විස්තර කරන්න.

iii. ජන නැටුමකින් පිළිබිඹු වන ජීවන තොරතුරු එම නර්තන නිර්මානයට බලපාන ආකාරය නිදසුන් සහිතව විස්තර කරන්න.

III කොටස

06. පහත සඳහන් වගුවෙහි 'අ' 'ආ' 'ඉ' යන කොටස් වලට අදාලව අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(අ) කොටස	(ආ) කොටස	(ඉ) කොටස
ශබ්දම්	තබ්ලාව	බැරිසිල්
තරානා	චෙන්ඩාව	ද නට් ක්‍රැකර්
පරන්	මෘදංගය	කරදිය
ටුම්රි	නටුවාංගම්	පටාචාරා

i. (අ) කොටසේ සඳහන් භරත නාට්‍යම් සම්ප්‍රදායට අදාල නර්තන අංගය තෝරා එහි සුවිශේෂී ලක්ෂණ විස්තර කරන්න.

ii. එම නාට්‍ය සම්ප්‍රදායට අයත් ප්‍රධාන අවනද්ධ භාණ්ඩය 'ආ' කොටසින් තෝරා එම වාදන භාණ්ඩය සහ සංගීත සම්ප්‍රදාය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

iii. රුසියාවෙන් ලොවට දායාද කල බැලේ නිර්මාණ අංගය 'ඉ' කොටසින් තෝරා පහත සඳහන් සිරස්තල යටතේ එය විස්තර කරන්න.

* තේමාව * සංගීත * රංග රචනය හා පසුබිම් අලංකරණය

07. රූපවාහිනිය මගින් ප්‍රචාරය වන නර්තන වැඩසහන් නැරඹීමේදී පෙරදිග මෙන්ම අපරදිග ආභාෂය ලබා ඇති බව පෙනේ.

i. එම නර්තන අංග සඳහා භාවිතා කර ඇති චලන කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

ii. ගීත අනුව නර්තන නිර්මාණකරණයේදී ඒ සඳහා සංගීතයෙන් ලැබෙන පිටුබලය පිළිබඳ විමසුමක් කරන්න.

iii. අයදතන රූපවාහිනී රියැලිටි ප්‍රසංග නර්තන කණ්ඩායම් බිහිවීම තුලින් නර්තන කලාවේ පැවැත්මට යහපතක් වේද? ඇගයීමක් කරන්න.

08. විවිධ ප්‍රසංගයක සාර්ථකත්වය රඳා පවතින්නේ ප්‍රසංගයේ පෙළ ගැස්ම මතය.

i. එහිදී වගකීම් පැවරිය යුතු කමිටු පෙළ ගස්වන්න.

ii. එවැනි උත්සව අවස්ථාවක් සඳහා පංති කාමරයේ දී ඔබ උගත් ගොප්කොළ හා රඹ පතුරු ආශ්‍රිත සැරසිලි නිර්මාණ දෙකක් සකස් කරගත් ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

iii. විවිධ ප්‍රසංගයක් සංවිධානය කර ඉදිරිපත් කිරීමෙන් ඔබ ලැබූ ඇත්දැකීම් විස්තර කරන්න.

I කොටස

1.	2	11.	4	21.	5
2.	3	12.	3	22.	3
3.	4	13.	2	23.	1
4.	1	14.	1	24.	5
5.	2	15.	5	25.	2
6.	5	16.	3	26.	පහතරට
7.	1	17.	2	27.	රුක්මණී දේවි අරුන්ඩේල්
8.	2	18.	5	28.	විභාව
9.	1	19.	1	29.	තම්මැට්ටම
10.	3	20.	3	30.	අවකාශ භාවිතය

31. ගොග් ගොග් ජිං ජිංගත
32. කීර්ති ශ්‍රී රාජසිංහ
33. 1943
34. නෙළුම් පොකුණ
35. කඩතුරා
36. 1. ස්ථානය - කවිකාර මඩුව 2. යුගය - මහනුවර
37. 1. ගිරාගම සෞන්දර්ය ගුරු විදුහල 2. 1972
38. 1. කොහොඹා හැල්ල 2. ආවැන්දුම
39. 1. තිසර 2. ගම්පොළ
40. 14 වන ලූවී රජු 2. ද ඇකඩමි රෝයල් ඩාන්ස්
41. 1. ජින් බැස්ටිස් ලිලී 2. පියරේ බියු චැම්ප්
42. 1. ඉතාලිය 2. ජේසන් සහ රන්ලොම් බැටළුවෝ
43. 1. ක්ෂණාන්ත 2. හීනාන්ත
44. 1. වේදිකාව 2. ප්‍රේක්ෂකාගාරය
45. 1. කලා ක්ෂේත්‍රය 2. කේරල කලා මණ්ඩලම්
46. 1. රතු 2. කළු
47. 1. මහ තනි තිත 2. සුළු මැදුම් දෙතිත
48. 1. 1892 2. ශාන්ත පීටර්ස් බර්ග් නගරය
49. 1. ආවැන්දුම 2. උඩරට නර්තන සම්ප්‍රදාය
50. 1. චෛකොස්කිව් 2. මාරියස් පෙටීපා

II පත්‍රය - I කොටස

(1)

I	1 2	1 2	1 2	1 2 3 4	1 2 3 4
කෙර නදිය	ඳ්‍රෝං -	න නු	ඳ්‍රෝ -	ත්‍රීං - න න	ක ර් ණි ට
නම් නදිය	+ +	නුද් -	ධ -	රා - - -	ජ - ය -
	+ +	වුත්‍ර් -	දෙ -	ප - ළ -	ලු - ව -
	+ +	දෙ වෙ	නු -	ඝ - - ද්	ධ - - ර්
	+ +	ම ය	ව -	ද් - - -	- - - ම්
	ආ -	- -	- -	- - - -	- - - -

නිවැරදි කාළ සංකේත භාවිතයට ලකුණු - 02
පද නිවැරදිව ප්‍රස්තාර කිරීම ලකුණු - 04
06

II

1′ 2 3	1′ 2 3	1′ 2 3	1′ 2 3
+ රන්ද් විලු	නිද්ද - දි	+ වීලු කෙ	ළි නා -
+ ළිස වූ	න් ට -	- - -	- - -
+ මැ ණිංක්	වි ළේ -	+ ද්‍රිය නා	- ලා -
+ ගොඩ වෙ	න් ට -	- - -	- - -

(ගුරු අත්පොතට අනුව)

බංකේත භාවිතයට - ලකුණු - 02
පද නිවැරදිව ප්‍රස්තාර නිර්මාණ ලකුණු - 04
06

III

1 2 3	1′ 2 3 4	1 2 3	1′ 2 3 4
රෑ ඳ ග	ජ්‍රිත් - න ඝ	න ඝ ට	කුල - ද්‍රිත් -
ත්‍රග් - ග	ජ්‍රිත් - න ඝ	න ඝ ට	කුල - ද්‍රිත් -
රෑ ඳ ග	ජ්‍රිල - ජ්‍රිල -	රෑ ඳ ග	ජ්‍රිල - ජ්‍රිල -
රෑ ඳ ග	ජ්‍රිත් - න ඝ	න ඝ ට	කු ඳ කු ඳ
ත්‍රග් - ග	ජ්‍රිත් - න ඝ	න ඝ ට	කුල - ද්‍රිත් -
රෑ ඳ ග	ජ්‍රිත් - න ඝ	න ඝ ට	කුල - ද්‍රිත් -
ලෝල - -	නා		

මුළු ලකුණු 20

බංකේත භාවිතයට ලකු. 02 , පද නිවැරදි බවට ලකුණු - 06

02. (i) කෝට්ටේ යුගයේ සංදේශ කාව්‍යයක් ඇසුරින් සාධකයක් ඉදිරිපත් කර ඇත්නම් (ලකුණු 6)
නිදසුන් * ලෙල දුන් නව තඹ පලුවන් පාදේ (පරෙවි සංදේශය)
* භරත සතර පෙර ඉසිවර කී ලෙසට (සැවුල් සංදේශය

(ii) * කෝට්ටේ යුගයේ 6 වන පැරකුම්බා රජුට කොහොඹා කංකාරියක් කල බව කුවේණි අස්නෙහි සඳහන් වීම. (ලකුණු 3)
මහනුවර යුගයේ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුට කොහොඹා කංකාරියක් කළ බව සිහබා අස්නෙහි සඳහන් වීම. (ල. 03)
නිදසුන් දෙක විස්තර කර ලියා තිබීම.

(iii) සමාජ ආර්ථික ප්‍රවණතා
විවිධ ආයතන හා නර්තන කණ්ඩායම් බිහිවීම. උදා:- සංස්කෘතික, තරුණසේවා, ත්‍රිවිධ හමුදා, පොලිස් .... ආදී
විවිධ උත්සව සඳහා නර්තනය යොදා ගැනීම. උදා:- මංගල, පිළිගැන්වීමේ, පෙරහැර ආදී
වෘත්තීය නර්තන කණ්ඩායම් බිහිවීම.
කාන්තාවන් නර්තයට පිවිසීම
සංගීත සංදර්ශන සඳහා නර්තන ඉදිරිපත් කිරීම. ආදී කරුණු 04 ක් විස්තර කර ලියා තිබීම.
(ලකුණු 8) (මුළු ලකුණු 20)

03. (i) ගායනය සහිත නර්තන අංග:- කුවේණි අස්න, කොහොඹා හැල්ල, මඩුපුරය
නර්තන අංග දෙකක් නම් කිරීම (ල. 02)
ගායනය රහිත නර්තන අංගයක් විග්‍රහ කර ලියා තිබීම. උදා:- භාවිතා කරන තාල රූප (ලකුණු 6යි)

(ii) උඩරට - ගැටබෙරය සබරගමු - දවුල
මෙම වාද්‍ය භාණ්ඩ දෙකෙහි රූප සටහන් ඇද යොදාගන්නා හම් වර්ග, හැඩය, යනාදී කරුනු තුළින් සමාන අසමාන ලක්ෂණ ලියා ඇත්නම් (ලකුණු 6)

(iii) රට යකුම, වලියක් මංගල්‍ය, පහන් මඩුව, කොහොඹා කංකාරිය, ආදී ශාන්තිකර්මයක එන නාට්‍යමය අවස්ථාවක් තෝරාගෙන එහි අනුරූපණය, සමාරෝපය, සහ සංවාද තුළින් විමසීමක් කර ඇත්නම්
(ලකුණු 8) (මුළු ලකුණු 20)

II කොටස

04. (i) අතීත ශාන්තිකර්ම රඟ මඩල තුළ ආලෝකකරණය සඳහා යොදාගත් පහන් වර්ග 04 ක් ලියා තිබීම.
උදා:- පොල් පන්දම, කාල පන්දම, අත් පන්දම, විලක්කු
ලිවීමට (ලකුණු 2) එකක් විස්තර කර ලියා තිබීම (ල. 04) (ල. 06)

(ii) ප්‍රාසාංගික නර්තන අංගයකට යොදා ගන්නා ආනුෂාංගික අංග ලෙස,
ආලෝකකරණය, වේදිකා පසුතල නිර්මාණය, රංග වස්ත්‍රාභරණ නිර්මාණ, අංග රචනය, පසුබිම් සංගීතය ආදී කරුණු තුලින් පිළිතුර විස්තර කර ලියා තිබීම. (ලකුණු 6)

(iii) මුලින්ම ස්වභාවික වස්තූන්ගෙන් ආලෝකය ලබාගත් ආකාරය විස්තර කිරීම.
ආදී මානවයා ආලෝකය ලබා ගැනීමට ගින්දර භාවිතා කල බව
අතීතයේ දී රංග කාර්ය සඳහා හුළු එළිය, පන්දම් එළිය, පහන් එළිය, ආදියෙන් ආලෝකය ලබාගත් බව
ලාම්පු භාවිතය, ඉටිපන්දම් භාවිතය මගින් ආලෝකය ලබා ගැනීමේ ක්‍රියාවලිය
18 වන සියවසේ අවසාන වන විට ගෑස් ආලෝකය භාවිතාය තෙත් වර්ධනය වූ බව
19 වන සියවසේ විදුලි ආලෝක භාවිතය ආරම්භ වූ බව
ක්‍රමිකව විකාශය වූ ආලෝකය වර්තමානයේදී රංගාලෝකකරණය ලෙසින් ස්වාධීන කලාවක් බවට පත්වීම.... ආදී කරුණු තුළින් ආලෝකකරණයේ විකාශය ලියා තිබීම.
උදා:- තාක්ෂණික උපකරණ භාවිතය, ආලෝක වර්ණ භාවිතය, අධිවේගී / මන්දවේගී දර්ශන, ප්‍රතිබිම්බ නිර්මාණ, රංග වස්ත්‍රාභරණ වල සිදුවන වෙනස්කම් (ලකුණු 8) (මුළු ලකුණු 20)

05. (i) සාමූහික බව, සමගිය හා සහජීවනය, සරල බව, වැඩිහිටියන්ට හා ගුර ැදෙමාපියන්ට ගරු කිරීම. ආගමික සබඳතා, හිරු සඳු වැනි ස්වභාවික වස්තු දේවත්වයෙන් පිදීම යනාදිය සඳහන් වීම.
වෘත්තීයන් හා බැඳි ආගමික, දේව භක්තිය කවි ඇසුරින් විස්තර කිරීම.
උදා:- වරම් වරම් ඉර සඳ දෙවි අතින් වරම්.... ඉරු දෙවියන්ගේ ඉරගල ගාවා
සාමූහිකත්වය නිරූපණයට ගායනා
උදා:- කොතන විලේදෝ එපන් තියෙන්නේ අඟනෝ එකතුව එතැනට යන්නේ (ලකුණු 6)

(ii) ගැමි නැටුම් වල ගායනා සරල බස් වහරකින් ලියා ඇති බව. එම ගායනා තුළින් ගැමි ජීවන රටාවන්, පිළිබිඹු වන බව
ගැමි ජනයා සියලු කටයුතු කිරීමට පෙර ත්‍රිවිධ රත්නයේ ආශිර්වාද ලබා ගැනීම, ජන නැටුම් තුළ ද දැකිය හැකි බව.
උදා:- කෘෂි කර්මාන්තය හා බැඳී ගායනා
පළමුව බුද්ධං සරණ නමකර , සතර වරම් දෙවි සතර දෙනාටයි, බෝ පත්ති මට අවසර දෙන්නේ
ජීවන රටාවේ මෙන්ම ගැමි නාටක ගායනා තුළ ඉර, සඳ, අව්ව, වැස්ස වැනි වස්තූන් දේවත්වයෙන් පිදීම.
* සිරිත් විරිත් ජීවන රටාව තුළින් ජන නාටක සඳහා බලා තැබීම.
* ගැමි ජීවනයේ සරල බව, උපකරණ භාවිතය, ඇදුම් පැළඳුම් භාවිතය තුලින් ලියා තිබීම. (ලකුණු 6)

(iii) * සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් වල පොදු ලක්ෂණ :- සාමූහික බව, එමකම, සරල රංග වස්ත්‍රාභරණ භාවිතා කිරීම, සංගීතය යොදා ගැනීම. ආදී කරුණු ඇතුළත් කර විස්තර කර තිබීම.
(ලකුණු 8) (මුළු ලකුණු 20)

06. (i) **<u>ශබ්දම්</u>**
* භරත නාට්‍යම් අරංගේත්‍රම් උළෙලක තුන්වෙහි නර්තන අංගය බව.
* භාව ප්‍රකාශනයට ප්‍රධාන ස්ථානයක් හිමිවන බව
* අක්ෂි සහ ගෙලෙහි චලන සිදුකර කෙටි ඡති කොටසක් ආරම්භ වන බව
* ක්‍රිෂ්ණ දෙවියන් අභිවන්දනය කරන බව
* මෙහිදී භක්තිය දනවන ගීත රාගවලට අනුව ගයන බව ආදී කරුණු තුලින් පිළිතුර ලියා ඇත්නම් නර්තන අංග හඳුනා ගැනීමට 01 (ලකුණු 6)

(ii) * ප්‍රධාන අවනද්ධ භාණ්ඩය මෘදංගය බව
* වාද්‍ය භාණ්ඩයේ රූප සටහනක් ඇද විස්තර කර ලියා තිබීම. (ලකුණු 3)
* දක්ෂණ භාරතීය කර්ණාටක තාල පද්ධතිය භාවිතා කරන බව හා එය විස්තර කිරීමට (ල. 03)

(iii) බැලේ නාට්‍ය අංගය ද නට් ක්‍රැකර් ලෙස හඳුනා ගැනීමට (ල. 01)
එහි තේමාව, සංගීතය, රංග රචනය, පසුබිම් අලංකරණය ආදී කරුණු ඔස්සේ පිළිතර ලිවීමට
(ලකුණු 7) (ලකුණු 8)

07. (i) නූතන ප්‍රාසාංගික නර්තන රූපවාහිනියත් සමඟ වඩාත් ප්‍රබලව සමීප ව ඇත.
නර්තන අංගයක අනන්‍යතාවය රැඳී පවතිනුයේ එහි මත බව
වර්තමානයේ දේහීය චලන මෙන්ම අපරදිග චලන යොදා ගෙන ඇති බව
ඉන්දීය චිත්‍රපට නර්තන චලන නිර්මාණ සඳහා යොදාගත ඇති බව
ගීත අනුව නර්තන නිර්මාණකරණයේදී වැඩි වශයෙන් බටහිර චලන යොදා ගන්නා බව
භාරතීය නර්තන අංග වල චලන යොදා ගන්නා බව
රංග වස්ත්‍රාභරණ ද චලන වලට ගැලපෙන ආකාරයෙන් යොදා ගැනීම.

යනාදී කරුණු හෝ වෙනත් අදාල කරුණු බාවිතා කර පිළිතුර ලියා තිබීම. (ලකුණු 6)

(ii) නර්තන නිර්මාණයේදී ගීත රචනයට වඩා සංගීතයට ප්‍රධානත්වයක් ලබාදෙන බව
සංගීත රිද්ම රටාවන්ට අනුව විවිධ චලන නිර්මාණය කරගත හැකිබව
ගීත ගායනයේදී සංගීතයේ වේග රිද්මයට අනුව නර්තන කිරීම සිදු කළ හැකි බව
වාද්‍ය භාණ්ඩ වල රිද්ම හා තාල රටාවන්ගේ ධ්වනි ගුණ ලක්ෂණ නර්තනයට බලපාන බව.
යනාදී කරුණු තුළින් සංගීතයෙන් ලැබෙන පිටුබලය විස්තර කර ලිවීමට (ලකුණු 6)

(iii) රූපවාහිනී රියැලිටි ප්‍රසංගවල නර්තන කණ්ඩායම් බිහිවීම.
තරඟකාරීත්වයට අනුව නව නර්තන කලාවට බලපෑම් සිදුවන බව
එක් එක් නාලිකා වල පවත්වන නර්තන වැඩසහටන් පිළිබඳව ලියා තිබීම.
නර්තන කණ්ඩායම් මෙහිදී දිනෙන් දින පෝෂණයට ලකම්ම තුළින් නර්තන කලාවේ පැවැත්මට යහපත් වන බව.
විචිත්‍ර වූ රංග වස්ත්‍ර මෙහිදී භාවිතා වන බව
නිර්මාණශීලි නර්තන අංග බිහිවීම තුළින් අයදතන නර්තන කලාවේ පැවැත්මට එය බලපාන බව ලියා තිබීම හා දක්ෂතා කුෂලතා නංවාගත හැකි බව
නර්තන අංග නිර්මාණය කිරීමට හැකිවන බව යනාදි කරුණු තුළින් නර්තනයේ පැවැත්මට රියැලිටි ප්‍රසංග බලපාන බව (ලකුණු 8) (මුළු ලකුණු 20)

IV කොටස

08. (i) උපදේශන කමිටු, ආරාධනා පත්‍ර සැකසීමේ කමිටු, සමරු කළපා සකස් කිරීමේ කමිටු , සැරසිලි කමිටුව, පිළිගැනීමේ හා අසුන් ගැන්වීමේ කමිටුව, පුහුණු කිරීමේ සම්බන්ධ කමිටුව, නර්තන අංග පෙල ගැස්වීමේ කටයුතු ආදී ලෙස පිළිතුරු ලියා තිබීම. (ලකුණු 6)

(ii) * සැරසිලි දෙකක් නම් කිරීම. උදා:- ගොප්ගෙඩිය, පහන් පැල, මල්පැල, පොල් තෙල් පහන දෙකක් නම් කිරීම (ලකුණු 2)
සැරසිලි දෙකක් සකස් කර ගන්නා ආකාරය විස්තර කර තිබීම. (රඹ පතුරු, ගොප් කොළ ආශ්‍රිතව)

(iii) පියවරෙන් පියවරට සංවිධානාත්මකව වගකීම් පැවරීම් තුළින් සාමුහිකව කාර්යයන් නිම කිරීමට හැකියාක් ලැබෙන බව.
වගකීම පැවරීම, ශක්‍යතා, කුසලතා, ප්‍රදර්ශනය වීම, කාර්‍යක්ෂමතාව, කණ්ඩායම් හැගීම, නිසි පුහුණුව, ලියා ඇත්නම් (ල. 08) මුළු ලකුණු 20)